# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2293/61 - 2022 අගෝස්තු මස 19 වැනි සිකුරාදා - 2022.08.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනත**

4 (2) වගන්තිය යටතේ කරනු ලබන පළකිරීම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය (මෙතැන් සිට ආයතනය ලෙස හැඳින්වේ) වෙත පැවරී ඇති බලතල අනුව, 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනතේ අරමුණු සඳහා මෙහි ප්‍රකාශයට පත් කර ඇති ක්‍රියා පටිපාටි මත ශ්‍රී.ලං.ගි.ප්‍ර. 4 (SLFRS 4) රක්ෂණ ගිවිසුම් වලට සංශෝධන ශ්‍රී.ලං.ගි.ප්‍ර. 9 (SLFRS 9) වෙතින් තාවකාලික නිදහස් කිරීම මෙම ප්‍රමිතිය 2025 ජනවාරි 1 දින හෝ ඉන්පසුව ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලසීමාවන් සඳහා බලාත්මක වේ.

කවුන්සිලයේ නියෝග,

ආර්. එස්. අනෝමා ප්‍රියදර්ශනි,
ලේකම්.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය,
අංක 30ඒ,
මලලසේකර මාවත,
කොළඹ 07.
2022 අගෝස්තු 19.


1A - PG 5961 — 00 (2022/06)



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී.ලං.ගි.ප්‍ර. 4 (SLFRS 4) රක්ෂණ ගිවිසුම්වලට සංශෝධන

20අ, 20ඒ සහ 20 ග ඡේද සංශෝධනය කෙරේ. නව පෙළට යටින් ඉරි ඇඳ ඇති අතර, මකා දැමූ පෙළ හරහා ඉරක් ඇඳ ඇත.

### ශ්‍රී.ලං.ගි.ප්‍ර. 9 (SLFRS 9) වෙතින් තාවකාලික නිදහස් කිරීම

20අ **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 9 (SLFRS 9) මූල්‍ය උපකරණ සඳහා ගිණුම්කරණය ආමන්ත්‍රණය කරන අතර, 2018 ජනවාරි ( හෝ ඉන් පසුව ඇරඹෙන වාර්ෂික කාල සීමාවන් සඳහා බලාත්මක වේ. කෙසේ වෙතත්, 2025 ~~2021~~ ජනවාරි 1 ට පෙර ආරම්භ වන වාර්ෂික කාල සීමාවන් සඳහා ශ්‍රී.ලං.ගි.ප්‍ර 9 (SLFRS 9) වෙනුවට LKAS 39 මූල්‍ය උපකරණ හඳුනා ගැනීම සහ මැනීම අදාල කර ගැනීමට රක්ෂණකරුට අවශ්‍ය නොවන නමුත්, 20ආ ඡේදයේ නිර්නායක සපුරාලන රක්ෂණකරුවෙකු සඳහා මෙ ශ්‍රී.ලං.ගි.ප්‍ර. (SLFRS) අවසර දෙන තාවකාලික නිදහස් කිරීමක් සපයයි. ශ්‍රී.ලං.ගි.ප්‍ර. 9 (SLFRS 9) හි තාවකාලික නිදහස් කිරීම යොදන රක්ෂණකරුවෙකු :**

**(අ) ...**

...

20ඒ නැවත ඇගයීමක ප්‍රතිඵලයක් ලෙස යම් අස්තිත්ත්වයක් ශ්‍රී.ලං.ගි.ප්‍ර. 9 (SLFRS 9) වෙතින් තාවකාලික නිදහස් කිරීම සඳහා තවදුරටත් සුදුසුකම් නොලබන්නේ නම් (20(එ) ඡේදය බලන්න), එවිට අස්තිත්ත්වයට වාර්ෂික ශ්‍රී.ලං.ගි.ප්‍ර. 9 (SLFRS 9) වෙතින් තාවකාලික නිදහස් කිරීම දිගටම යෙදීමට අවසර දෙනු ලබන්නේ එම නැවත ඇගයීමෙන් පසු වහාම ආරම්භ වූ කාලය වාර්ෂික අවසන් වන තෙක් පමණි. එසේ වුවද අස්තිත්ත්වය 2025 2021 ජනවාරි 1 හෝ ඉන් පසුව ඇරඹෙන වාර්ෂික කාලසීමාවක් සඳහා ශ්‍රී.ලං.ගි.ප්‍ර. 9 (SLFRS 9) යෙදිය යුතුය. උදාහරණයක් ලෙස, අස්තිත්ත්වයක් 2018 දෙසැම්බර් 31 දින (එහි වාර්ෂික කාලය අවසන් වනවිට) 20(ඒ) (අ) ඡේදය අයදුම් කරමින් ශ්‍රී.ලං.ගි.ප්‍ර. 9 (SLFRS 9) වෙතින් තාවකාලික නිදහස් කිරීම සඳහා තව දුරටත් සුදුසුකම් නොලබන බව තීරණය කරන්නේ නම්, එම අස්තිත්ත්වයට ශ්‍රී.ලං.ගි.ප්‍ර. 9 (SLFRS 9) වෙතින් තාවකාලික නිදහස් කිරීම දිගටම යෙදීමට අවසර ලැබෙන්නේ 2019 දෙසැම්බර් 31 දක්වා පමණි.

...

### ශ්‍රී.ලං.ගි.ප්‍ර. 28 හි නිශ්චිත අවශ්‍යතා වලින් තාවකාලික නිදහස් කිරීම

20ග LKAS 28 හි 35 - 36 ඡේද ආශ්‍රිත සහ හවුල් ව්‍යාපාර ස්කන්ධ ක්‍රමය භාවිතා කරන විට ඒකාකාර ගිණුම්කරණ ප්‍රතිපත්ති යෙදීමට අස්තිත්ත්වයට අවශ්‍ය වේ. එසේ වුවද, 2025 ~~2021~~ ජනවාරි 1 දිනට පෙර ආරම්භ වන වාර්ෂික කාල සීමාවන් සඳහා පහත සඳහන් පරිදි ආශ්‍රිත හෝ *හවුල්* ව්‍යාපාර විසින් අදාල ගිණුම්කරණ ප්‍රතිපත්ති රඳවා ගැනීමට අස්තිත්ත්වයට අවසර ඇති නමුත් අවශ්‍ය නොවේ:

**(අ)...**

…

EOG 09 - 0046

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කර ඇත .